චක්‍රලේඛ අංක 01/2014

මගේ අංකය-බ.ප.සේ.කො./6/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව ,
121/3, කිරුළපන මාවත,
කොළඹ 05,
2014.01.

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස සමිතිවල
සභාපතිවරුන් වෙත.

## සමූපකාර සේවකයින් සඳහා 2014 වර්ෂයේ නිවාඩු.

සමූපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමූපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ. මේ අනුව පහත සඳහන් දිනයන් සමූපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

| | | |
|---|---|---|
| 1) ජනවාරි | - 14 | දෙමළ තෛපොන්ගල් දිනය/ (මීලා-දුන්-නබී) නබි නායක තුමාගේ ජන්ම දිනය |
| 2) පෙබරවාරි | - 04 | ජාතික දිනය |
| 3) අප්‍රේල් | - 13 | සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනයට පෙර දිනය |
| 4) අප්‍රේල් | - 14 | සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය |
| 5) මැයි | - 01 | මැයි දිනය |
| 6) මැයි | - 15 | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 7) දෙසැම්බර් | - 25 | නත්තල් උත්සව දිනය |

ඉහත සඳහන් දිනයන්ට අමතරව සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් සමූපකාරයින්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන දිනය ද නිවාඩු වශයෙන් දිය යුතුය. තව ද මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි " රජයේ නිවාඩු " දිනයන් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන දිනයන් සඳහා සිය සේවකයින් සඳහා නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළහොත් එවැනි අවස්ථාවල සමූපකාර සමිතිවලට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින් ට නිවාඩු දීම පිළිබඳ තීරණය කළ හැකිය.

2014 වර්ෂය සඳහා සිංහල/දෙමළ අවුරුද්දට පෙර දිනයන් නිවාඩු වශයෙන් යොදා ගෙන ඇති බැවින් පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාලය හෝ ප්‍රාදේශිකයන් මේ දිනවල එක් දිනයක් හෝ දින දෙකම විවෘතව තැබීමටත්, එම දිනවල වැඩ කිරීම සඳහා සේවකයින්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබේ. එසේ ක්‍රියා කරන ලැබූ විටදී ඉහත සඳහන් පරිදි සේවයේ යොදාගත් සේවකයින්ට එසේ සේවයේ යොදාගත් දින ගණනට සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලත දී සේවකයින්ට නිවාඩු ලබා දිය යුතුය. මෙසේ සමිති කාර්යාලයක්, සමිති ප්‍රාදේශිකයක් විවෘතව තබන අවස්ථාවේදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබුවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත් ඉන් කොටසක් වුවත් නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

03. ඉහත දැක්වූ නිවාඩු දිනවලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු 1 ½ ට ඇතුලත් වුවහොත් ඒ වෙනුවෙන් පිළිවෙළින් අඩ දිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින 30 ඇතුලතදී සේවකයන්ට නිවාඩු වශයෙන් ලබා දිය යුතුය. මීට විකල්පයක් වශයෙන් දෙපක්ෂයේ එකඟතාව ඇතිව ඒ වෙනුවට දින භාගයක් හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවීම් කළ හැකි වේ.

ඩබ්.පී.එම්.පී.ආර්.ශාන්ත කුමාර මුහන්දිරම්,

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව,

බස්නාහිර පළාත.

පිටපත් :-

1. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
2. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කළා කටයුතු ආහාර සැපයීම් හා බෙදා හැරීම් සමුපකාර සංවර්ධන හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
3. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
4. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව
5. සියළුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
6. සියළු වෘත්තීය සමිති සංගම්